**ඉමදූව ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉමදූව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු සවි කිරීම් හා යන්ත්‍ර යන්ත්‍රෝපකරණ වටිනාකම් පිළිවෙලින් රු.309,650 ක් හා රු.105,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | තවදුරටත් මෙවැනි අඩුපාඩු සිදු නොවීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කර ඇති බව. | වැය විෂයයන් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි වෙනුවෙන් දරන ලද රු.592,298 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජනල් සටහන් යොදා නිවැරදි කර ඇති බව. | ප්‍රාග්ධනිත කළයුතු වියදම් ප්‍රාග්ධනිත කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල හිලව් කරන ලද රු.250,000 ක තැන්පතු මුදලද තැන්පත් ගිණුමෙන් ඉවත් කර නොතිබීමෙන් තැන්පත් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | තවදුරටත් මෙවැනි අඩුපාඩු සිදු නොවීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කර ඇති බව. | නිරවුල් කරන ලද තැන්පතු ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | එකතු වටිනාකම රු.55,137 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 23 ක් යන්ත්‍ර හා උපකරණ යටතේ සටහන් වීමෙන් ස්ථාවර වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | තවදුරටත් මෙවැනි අඩුපාඩු සිදු නොවීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කර ඇති බව. | ඉන්වෙන්ට්‍රි තොග ප්‍රාග්ධනිත නොකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වටිනාකම රු.123,100 කට මිලට ගත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ප්‍රධාන ලෙජරයේ රු.109,600 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | 2024 අවසන් ගිණුම් මගින් ජනල් සටහන් යොදා නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැඩිපුර ලැබුණු රු.2,207,102 ක මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2024 අවසන් ගිණුම් මගින් ජනල් සටහන් යොදා නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.108,504 ක වෙනසක් පැවතුණි. | අදාල උපයෝගී ලේඛන හා ගිණුම අතර සැසඳීමක් සිදුනොවීමෙන් අදාල ශේෂය ඇති වී ඇති බව. | උපයෝගී ලේඛන හා මූල්‍ය ප්‍රකාශ අතර සැසඳීමක් සිදු කල යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.34,325,464 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිවැරදි උපලේඛන සකස් කර ඉදිරිපත් කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වන වගන්තිය | විධිවිධාන වලට අනුකූල නොවන පරිදි පිට පළාත් වල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් ලැබිය යුතු රු.5,286,615 ක මුද්දර ගාස්තු අය කර ගැනීම වෙනුවෙන් සභාවේ ලේකම් සහ නිලධාරීන් දෙදෙනෙකු සඳහා දිරි දීමනා වශයෙන් සභා අරමුදලින් රු.138,597 ක් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් කර ඇති බව පිළිගන්නා බව. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.11,080,978 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.6,273,156 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,385,000 | 6,262,385 | 6,508,920 | 1,812,169 | 2,920,600 | 4,131,840 | 4,314,319 | 2,058,704 |
| කුලී | 5,268,000 | 3,509,356 | 3,509,356 | - | 4,411,000 | 1,889,800 | 1,889,800 | - |
| බලපත්‍ර ගාස්තු | 2,336,000 | 1,109,245 | 1,127,245 | 82,100 | 927,200 | 1,434,171 | 1,448,671 | 100,100 |
| වෙනත් ආදායම් | 41,616,500 | 7,459,843 | 7,517,041 | 242,232 | 6,847,700 | 6,305,641 | 6,313,776 | 299,430 |
| | 54,605,500 | 18,340,829 | 18,662,562 | 2,136,501 | 15,106,500 | 13,761,452 | 13,966,566 | 2,458,234 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.2,458,234 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,136,501 ක හිඟ ශේෂයක් අයවීමට පැවැතුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 49 ක් පැවති අතර, සභාව විසින් ඉන් වසම් 02 කට අදාළව පමණක් වරිපනම් බදු අය කිරීමට කටයුතු කර තිබුණි. | ඉදිරි කටයුතු සිදු කර වරිපනම් එකතු කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | නව වරිපනම් ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 වර්ෂය සඳහා කිසිදු වරිපනම් බදු මුදලක් ගෙවා නොමැති දේපල 150 කින් රු.923,541 ක් අය වීමට පැවතුණි. | හිගය අයකර ගැනීම සඳහා ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කරන බව. | වරිපනම් බදු අයකල යුතුය. |
| (ඈ) | සභා සීමාව තුළ පැවති දැන්වීම් පුවරු 68 කින් රු.1,513,680 ක ආදායමක් අයකරගෙන නොතිබුණි. | ලිපි මඟින් අදාල පුද්ගලයින් දැනුවත් කර ඇති බව. | ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.13,169,514 ක් විය. | 2024.05.13 දින වන විටලැබිය යුතුව පැවති උසාවි දඩ හා මුද්දර ගාස්තු ඉමදුව සභාව වෙත ලැබී අවසන් බව. | නියමිත දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත 89 ක් එම බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම හේතුවෙන් රු.400,500 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, එවා අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | නියමිත පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතුය. |
| (ආ) | පිරිවැය රු.100,000 ක් වූ 49 – 0342 දරන ට්‍රැක්ටරයේ කොටස් සහ ලියාපදිංචි අංකය සහ පිරිවැය හඳුනා ගත නොහැකි ට්‍රේලරයේ අබලි ද්‍රව්‍ය වසර 10 ක කාලයක සිට උප කාර්යාල භූමියේ ගොඩගසා තිබුණි. | මෝටර් රථ දෙපාර්තමේන්තුවේ නිර්දේශ සඳහා යොමු කොට ඇති බැවින් නිර්දේශ ලද පසු ඒ අනුව කටයුතු කරන බව. | අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවර්ධන බලපත්‍රයකට අදාලව අනුමැතියකින් තොරව ඉදිකර තිබුණු වර්ග මීටර් 334.7 ක් සඳහා රු.502,050 ක් ද වාහන නැවතුම් ස්ථාන 10 ක් සඳහා රු.2,500,000 ක් ද අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නෛතික ක්‍රියාමාර්ග සඳහා යොමුවන බව | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සභාවට ලබා දී තිබුණු පිරිවැය රු.7,967,144 ක් වටිනා (ෆොටෝන්) ගල් රෝල වසර 02 ක කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ලිවර් ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇති බව. | වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේ සභාවට ලබා දී තිබුණු රු.2,655,318 ක් වටිනා ට්‍රැක්ටරය 2019 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. | මෙම රථය වෙනත් වාහනයක් සමඟ හුවමාරු කර ගැනීම පළාත් පාලන කොමසාරිස්ගෙන් ඉල්ලීම් කර ඇති බව. | වත්කම් ඵලදායීව යොදා ගත යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 17 කට පෙර රු.9,605,882 ක වියදමක් දරා ඉමදුව නගර මධ්‍යයේ ඉදිකර තිබුණු වර්ග මීටර් 260 ක වෙළඳ සංකීර්ණය ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා ගැනීමට හැකි පරිදි අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ඵලදායී ආර්ථික කටයුතු සඳහා යෙදවීමට සැලසුම් කර ඇති බව. | වෙළෙඳ සංකීර්ණය ඵලදායි ආර්ථික කටයුත්තකට යෙදවිය යුතුය. |
| (ආ) | 2022 / 2023 වර්ෂයේ සභා අරමුදල් මඟින් මාර්ග 05 කට අදාළව වර්ග මීටර් 640 ක් ආවරණය වන පරිදි මාර්ග කොන්ක්‍රීට් කර තිබුණ ද ඒ සඳහා සිදු කරන ලද වැඩ ප්‍රමාණය පිළිබඳව තහවුරුවක් ලබා ගැනීමකින් තොරව යන්ත්‍ර පැය 23 ක් සඳහා රු.119,970 ක් අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණි. | මෙම මාර්ග 04 සඳහා ඇස්තමේන්තු කර ඇති මීටර් පැය ගණන 34 ක් වුවද කාර්යයේ ස්වභාවය අනුව සිදු කල වැඩ පැය ගණන 23 ක් සඳහා පමණක් ගෙවීම් සිදු කර ඇති බව. | වැඩකල භෞතික ප්‍රමාණය අනුව ගෙවීම් කිරීමට අදාල නියමිත මිල ගණන් භාවිතා කල යුතුය. |
| (ඇ) | හොරදූගොඩ මැකිලියේ සිට කෝදාගොඩ තාරමුල්ල දක්වා පිටවාන් ඇල මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 02 යටතේ ඇල මාර්ගයේ කැපීම් කටයුතු සඳහා රු.26,048 ක් ද වැඩ විෂය අංක 03 යටතේ කැපීම් කරන ලද පස් යොදාගෙන ඇල මාර්ගයේ වේල්ල සකස් කිරීමේදී රු.442,959 ක් ද වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | නියමිත මිල අනුපාත භාවිතා කල යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.182,510 ක ණය ශේෂයක් පැවතුණි. | ඔවුන්ට විශ්‍රාම හිමිකම නොමැති නිසා අයකර ගැනිමට නොහැකි වී ඇති බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |